සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT

මගේ අංකය / எனது இல / My No: DSD/HO/01/Publication
ඔබේ අංකය / உமது இல / Your No: ..............
දිනය / திகதி / Date: 2018.07.11

දිස්ත්‍රික් ලේකම් / අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂ ,
ප්‍රාදේශීය ලේකම්,
සමෘද්ධි කළමනාකරු,
සමෘද්ධි සංවර්ධන නිලධාරි.

**සමෘද්ධිලාභී අඩු ආදායම්ලාභී පවුල් දැණුවත් කිරීම, අධ්‍යාපනික / පුහුණු / ධාරිතා සංවර්ධනය සඳහා අත් පත්‍රිකා, කුඩා ප්‍රමාණයේ ප්‍රකාශන සන්නිවේදන පත්‍රිකා පිළියෙල කිරීම.**

සමෘද්ධි ව්‍යාපාරය තුල ඉතා දීර්ඝ කාලීනව අදාල ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වුව ද ඒ සඳහා අවශ්‍ය දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ ප්‍රවේශයන් සංවර්ධනය වීම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වේ.

සමෘද්ධිලාභී පවුල් මෙන්ම අඩු ආදායම්ලාභී පවුල් සමෘද්ධි වැඩසටහනේ විවිධ ක්ෂේත්‍ර සම්බන්ධව කටයුතු කරනු ලබයි. සමෘද්ධි පවුල් සවිබලකරණය සඳහා, පුහුණු හා ධාරිතා සංවර්ධන අරමුණු වන විවිධ ආකාරයේ ප්‍රවේශයන් භාවිතා කළ හැක. ඒ සඳහා විවිධ විෂයන් හා ක්ෂේත්‍රයන් පිළිබඳ නිර්මාණය කළ හැකි දැනුවත් කිරීම් අත්පත්‍රිකා, කුඩා ග්‍රන්ථ, පෝස්ටර් ආදිය මගින් ඉතා පුළුල් දැනුවත් කිරීමේ ප්‍රවේශයක් ගොඩනැගිය හැක.

සමෘද්ධි ව්‍යාපාරය සඳහා සෘජුව හෝ වක්‍රව දායකත්වය ලබා දෙන නිලධාරින්ට / නිලධාරිනියන්ට තමා සතු දැණුම හා අත්දැකීම් භාවිතය මගින් මේ සඳහා දායක වීමට ඉඩ කඩ පවතී. එමෙන්ම එවැනි නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා මේ මගින් විවෘත ආරාධනයක් ද සිදු කෙරේ.

සමෘද්ධි ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සමෘද්ධි කාර්යාල පරිශ්‍රයන් මෙන්ම සමෘද්ධි බැංකු ජාලයද මෙවැනි නිර්මාණශීලි දැනුවත් කිරීමේ මධ්‍යස්ථාන බවට පත් කිරීමේ හැකියාව ඇත.

මේ සඳහා ඔබ පෞද්ගලිකව හෝ කණ්ඩායමක් ලෙස උනන්දුවන්නේ නම් ඔබගේ එවැනි නිර්මාණ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කළ හැක. මේ යටතේ පහත සඳහන් මාතෘකාවක් යටතේ හෝ වෙනත් ඕනෑම අදාල විය හැකි විෂය ක්ෂේත්‍රයක් යටතේ එවැනි පත්‍රිකා, ලේඛණ, පෝස්ටර්, කෙටුම්පත් හෝ මුද්‍රණය සඳහා පිළියෙල කල නිර්මාණ ඉදිරිපත් කල හැක.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் (நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

- ආර්ථික, සමාජයීය, සංස්කෘතිකමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය විය හැකි දැනුම ලබා දෙන නිර්මාණ.
- සමෘද්ධි ව්‍යාපාරය තුල ලබා ගත හැකි ප්‍රතිලාභ, ඒවා භාවිතා කළ යුතු ආකාරයෙන්, උදා - සමෘද්ධි බැංකු මගින් ඉටු කරන සේවාවන්,ලබාදෙනු ලබන ආධාර නිසි භාවිතය
- සමෘද්ධිලාභින් තුල දියුණු කළ යුතු ගුණාංග පිළිබඳ අවධානය යොමු කිරීමට අදාල නිර්මාණයන්.
- සමෘද්ධි වැඩසටහන තුල දිරිගැන්විය යුතු භාවිතාවන් පිළිබඳ විස්තරවන නිර්මාණයන්.
- වෙනත් අධ්‍යාපනික හා දැණුවත් කිරීම් සඳහා යොදා ගත හැකි නිර්මාණ.

ඔබ හෝ ඔබ අංශය මගින් එකී නිර්මාණ කෙටුම්පත් කර හෝ මුද්‍රණය සඳහා සුදුසු පරිදි සකස් කර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙම පත්‍රිකා කුඩා ප්‍රමාණයේ ප්‍රකාශනයන් නිර්මාණය කිරිමේදි ඉතා සරල භාෂාවෙන් සකස් කිරීම, අවශ්‍ය පරිදි ගැලපෙන ඡායාරූප, කාටුන් හෝ අර්ථයට ගැලපෙන නිර්මාණ යෙදීම, කෙටියෙන් පැහැදිලි කිරීම්, අවධානය යොමුවන මට්ටමේ පෙනුමකින් සකස් කිරිම, ප්‍රධාන අදහස් කැපී පෙනෙන පරිදි හේතුව මගින් කිසියම් නිශ්චිත දැනුමක් හෝ අවබෝධයක් ලබාදීම වැනි කරුනු පිළිබඳ සැලකිල්ලක් දැක්විය යුතුවේ.

මෙම කටයුතු වඩාත් ඵලදායි ලෙස මෙහෙයවීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ප්‍රකාශන කාර්යාංශයක් ස්ථාපිත කොට ඇත. තෝරා ගන්නා වඩාත් යහපත් මට්ටමේ ඇති නිර්මාණ, නිර්මාණකරුගේ නමින් ප්‍රකාශයට පත් කරනු ඇත. එලෙස ප්‍රකාශනය කරනු ලබන නිර්මාණ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම්/ ප්‍රජාමූල බැංකු ආදිය මගින් අවශ්‍ය අයගේ පරිහරනය සඳහා ප්‍රදර්ශනය කරනු ඇත.

ප්‍රදර්ශනය සඳහා සුදුසු වැඩ පිළිවෙලක් හා ස්ථාන පිළිබඳව අදාල අංශ භාර නිලධාරින්ගේ අවධානය යොමු කළ යුතු වේ. අදාල කාර්යාල පරිශ්‍රයන්හි ඉදිරිපස මෙම නිර්මාණ ප්‍රදර්ශන ස්ථානයක් පිළියෙල කිරිමට කටයුතු කල හැක.

මෙම කාර්ය සාර්ථක කර ගැනීම සඳහා හැකියාව සහිත සියළු දෙනාගේ අවධානය යොමු කරවීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ජේ.දඩල්ලගේ,
අධ්‍යක්ෂ ජනරාල්.
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත ; මාණ්ඩලික නිලධාරින් (සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව) - අ.ක.ස.